කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 02 WWL /19/12/18/02
වර්ණය : රතු

## තද වැසි පිලිබඳ අනතුරු ඇඟවීමේ නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2019 දෙසැම්බර් මස 20 වන දින පෙ.ව. 11.00 වන තෙක් වලංගු වන පරිදි
2019 දෙසැම්බර් මස 18 වන දින පෙ.ව. 11.00 ට නිකුත් කරන ලදී.

### ගොඩබිම් ප්‍රදේශ සඳහා

ඊසාන දිග මෝසම් කාලගුණ තත්ත්වය සක්‍රිය වීම හේතුවෙන්, දිවයින පුරා, විශේෂයෙන් උතුරු, නැගෙනහිර සහ ඌව පළාත්වලත් පොලොන්නරුව දිස්ත්‍රික්කයේත් වැසි තත්ත්වයේ වැඩි වීමක් තවදුරටත් බලාපොරොත්තුවේ.

නැගෙනහිර සහ ඌව පළාත්වලත් නුවරඑළිය , මාතලේ, පොලොන්නරුව සහ මුලතිවු දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට මි.මී. **(100-150)** පමණ තද වැසි ද, සබරගමුව සහ බස්නාහිර පළාත්වලත් මහනුවර, හම්බන්තොට සහ ගාල්ල දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට මි.මී. **75-100** පමණ තරමක් තද වැසි ද ඇතිවිය හැක.

උතුරු-මැද, වයඹ, මධ්‍යම සහ ඌව පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයේත් සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 50 දක්වා වැඩි විය හැක.

### අද පෙ.ව. 08.30 වනවිට තත්ත්වය

2019.12.17 පෙ.ව 8.30 සිට 2019.12.18 පෙ.ව 08.30 දක්වා කාලය තුල වාර්තාවී ඇති වර්ෂාපතන අගයන් පහත දැක්වේ.

| වර්ෂාපතන මධ්‍යස්ථානය | වර්ෂාපතනය (මි.මී.) |
|---|---|
| නාඋල (NBRO-මාතලේ දිස්ත්‍රික්කය) | 134.0 |
| පුවක්පිටිය (NBRO-මාතලේ දිස්ත්‍රික්කය) | 102.0 |
| බකමූණ (පොළොන්නරුව දිස්ත්‍රික්කය) | 128.8 |
| ඇළහැර(පොළොන්නරුව දිස්ත්‍රික්කය) | 108.0 |
| ගිරාඳුරුකෝට්ටෙ (බදුල්ල දිස්ත්‍රික්කය) | 83.2 |
| නවකිරිආරු වැව (අම්පාර දිස්ත්‍රික්කය) | 77.5 |

### සිදුවිය හැකි හානි

- කඳුකර ප්‍රදේශවල නායයාම් ඇතිවිය හැක.
- පහත් බිම් ජලයෙන් යටවිය හැක.
- මාර්ග අසල ඇති විශාල ගස් ගැලවී යා හැක.

වර්ෂාපතනය(මි.මී) : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග

- කඳුකර ප්‍රදේශ වල (විශේෂයෙන් නාය යාම් අවධානම සහිත ප්‍රදේශ වල) ජීවත් වන ජනතාව මේ සම්බන්ධයෙන් විමසිලිමත්වන්න.
- කඳුකර ප්‍රදේශ වල මාර්ග භාවිත කරන්නන් සහ රථ වාහන පදවන්නන් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.
- අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්න.
- කඩාවැටෙන ගස්වලින් සහ විදුලි රැහැන් වලින් ආරක්ෂාවීම.
- කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉදිරි නිවේදන පිලිබඳ අවධානයෙන් සිටින්න.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.

| වර්ණය: -රතු<br>අනතුරු ඇඟවීම (පියවර ගන්න) | වර්ණය: -ඇම්බර්<br>අවවාදාත්මක (සූදානම් වන්න) | වර්ණය: - කහ<br>(අවධානයෙන් ඉන්න) | වර්ණය: -කොළ<br>(බලපෑමක් නැත) |
|---|---|---|---|

**රතු නිවේදනය යනු "රතු අනතුරු ඇඟවීමක්" නොව "අවශ්‍ය පියවර ගන්න" ලෙසට කරන දැනුම් දීමකි.




වර්ෂාපතනය(මි.මී) : තරමක් තද වැසි: 50 -100, තද වැසි: 100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි